පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : ගණිතය

සතිය : 05

සකස් කිරීම : කමල් ගීතදේව මයා, ගණිත ගුරු උපදේශක, මාවනැල්ල අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය :6

**පාඩම :- පූර්ණ සංඛ්‍යා මත ගණිත කර්ම ( 2 වන සතිය)**

**කාලච්ඡේද ගණන :- 10**


පූර්ණ සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීම පිළිබඳව පෙළපොතේ 28,29 පිටු කියවා හොඳින් අධ්‍යයනය කරන්න.


- පහත දැක්වෙන ගුණන වගුව සම්පූර්ණ කරන්න.

| x | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 1 | | | | 3 | | | | | | | | | |
| 2 | | | | 6 | | | | | | | | | |
| 3 | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 |
| 4 | | | | 12 | | | | | | | | | |
| 5 | | | | 15 | | | | | | | | | |
| 6 | | | | 18 | | | | | | | | | |
| 7 | | | | 21 | | | | | | | | | |
| 8 | | | | 24 | | | | | | | | | |
| 9 | | | | 27 | | | | | | | | | |
| 10 | | | | 30 | | | | | | | | | |
| 11 | | | | 33 | | | | | | | | | |
| 12 | | | | 36 | | | | | | | | | |

ගුණන වගුව භාවිතයෙන් පහත හිස් තැන් සඳහා සුදුසු අගය ලියන්න.

1)



පෙළපොතේ 30 පිටුවෙහි 3.3 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.

පූර්ණ සංඛ්‍යාවක් 10 න් 100 න් 1000 න් ගුණ කිරීම පිළිබඳව පෙළපොතේ 30 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න.

සංඛ්‍යාවක් 10 න් 100 න් 1000 න් ගුණ කිරීමේදී ලැබෙන පිළිතුර පළමු සංඛ්‍යාවේ දකුණු පසට යෙදෙන බින්දු ගණන ඇසුරින් අවබෝධ කරගන්න.

- පහත වගුව සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| 3 x 10 | 30 |
| 7 x 10 | |
| 2 x 100 | |
| 15 x 100 | |
| 2 x 1000 | 2000 |
| 8 x 1000 | |
| 13 x 1000 | |

පෙළපොතේ 32 පිටුවෙහි 3.4 අභ්‍යාසයේ පළමුවන ප්‍රශ්නය නිවැරදිව සම්පූර්ණ කරන්න.

> සංඛ්‍යා දෙකක ගුණිතය සෙවීමේදී විශාල සංඛ්‍යාව කුඩා සංඛ්‍යාවෙන් ගුණ කල යුතුය.

පූර්ණ සංඛ්‍යාවක් තවත් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීම පිළිබඳව පෙළපොතේ 31 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. පහත නිදසුන් ද අවබෝධ කරගන්න.

```
     7 4
  x  3 7
  -------
   5 1 8  <--  74 x 7 = 518
 2 2 2 0  <--  74 x 30 = 2220
  -------
 2 7 3 8
  =======
```

```
   1 5 3
  x  6 5
  -------
   7 6 5  <--  153 x 5 = 765
 9 1 8 0  <--  153 x 60 = 9180
  -------
 9 9 4 5
  =======
```

පෙළපොතේ 32 පිටුවෙහි 3.4 අභ්‍යාසයේ 2,3,4,5,6,7 ප්‍රශ්න නිවැරදිව සම්පූර්ණ කරන්න.

පූර්ණ සංඛ්‍යාවක් තවත් පූර්ණ සංඛ්‍යාවකින් බෙදීම පිළිබඳව පෙළපොතේ 36 පිටුව කියවා අවබෝධ කරගන්න.

- ලබ්ධිය හා ශේෂය යනු කුමක්දැයි හඳුන්වන්න.

පහත දැක්වෙන උදාහරණ නිවැරදිව අධ්‍යයනය කරන්න.

$40 \div 10 = 4$
$500 \div 10 = 50$
$300 \div 100 = 3$
$8000 \div 100 = 80$
$5000 \div 1000 = 5$
$50000 \div 1000 = 50$

ඉහත උදාහරණ අනුව පූර්ණ සංඛ්‍යාවක් 10 න් 100 න් 1000 න් බෙදීමේදී අනුගමනය කල යුතු ක්‍රියා පිලිවෙල පෙලපොතේ 34 පිටුව අධ්‍යයනය කර තවදුරටත් තහවුරු කරගන්න.

පහත දැක්වෙන උදාහරණ නිවැරදිව අධ්‍යයනය කරන්න.

$525 \div 7$

```
     75
 7 | 525
   | 49      7x7 = 49
     35
     35      7x5 = 35
     --
      0
```

$525 \div 7 = 75$

$519 \div 12$

```
      43
 12 | 519
    | 48      12x4 = 48
      39
      36      12x3 = 36
      --
       3
```

$519 \div 12$ = 43 යි ඉතිරි 3 යි.

| |
|---|
| පූර්ණ සංඛ්‍යාවක් තවත් පූර්ණ සංඛ්‍යාවකින් බෙදීමට දීර්ස බෙදීමේ ක්‍රමය යොදාගත හැක. |

- පෙළපොතේ 36 පිටුවේ නිදසුන 1 තවදුරටත් අධ්‍යයනය කරන්න.
- පෙළපොතේ 36 පිටුවෙහි 3.5 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.